# THE WESTMINISTER MODEL IN SRI LANKA AND ITS CHANGES (Part I)

# සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට පසුබිම වූ ප්‍රධාන සාධක

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ලංකාව තව දුරටත් බ්‍රිතාන්‍ය කිරීටයේ රාජ්‍යයක් වශයෙන් නොපැවතිය යුතු යැයි ප්‍රබල මතයක් ගොඩනැඟීම.

- ලංකාව සමූහාණ්ඩුවක් බවට පත් කිරීමේ අවශ්‍යතාව.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් පැවති ගැටලු.

මේ සම්බන්ධයෙන් සලකා බලා ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණයක් කිරීම සඳහා අවස්ථා දෙකක දී පියවර ගත්ත ද ඒවා සාර්ථක වූයේ නැත.

Classwork.LK

I. මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුවේ අගමැති එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 1957 නොවැම්බර් 2 ව්‍යවස්ථා සංශෝධන කිරීම සඳහා ඒකාබද්ධ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කළේ ය. 1959 පෙබරවාරි 6 දින මෙම කමිටුව පොදු එකඟතාවකට පැමිණ තිබිණි. විශේෂයෙන් ලංකාව සමූහාණ්ඩුවක් කළ යුතු බවට හා නව ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීමේ අවශ්‍යතාව ය පිළිබඳ ව මෙම කමිටුවට නියෝජනය කළ සියලු දේශපාලන පක්ෂ අතර පොදු එකඟතාවක් තිබිණි. එහෙත් 1959 සැප්තැම්බර් මාසයේ දී බණ්ඩාරනායක ඝාතනය හේතුවෙන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ අඩාළ විය.

II. 1965 මාර්තු මස පත් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ලංකාව සමූහාණ්ඩුවක් බවට පත් කිරීම සඳහා ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ඒමේ අදහසින් පාර්ලිමේන්තු ඒකාබද්ධ කාරක සභාවක් පත් කළ ද විපක්ෂය නව ව්‍යවස්ථාවක් සකස් කළ යුතුය යන මතයේ දැඩි ව රැඳී සිටීම නිසා සෝල්බරි ව්‍යවස්ථාව වෙනස් කිරීමට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට හැකියාවක් නොවී ය.

ClassWork.LK

එබැවින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට නියත පියවර ගන්නා ලද්දේ 1970 න් පසු සමගි පෙරමුණ ආණ්ඩුව ය. නව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් මඟින් කෙටුම්පත් කර පනවන ලද ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව 1972 මැයි මාසයේ සිට 1978 වසර දක්වා ක්‍රියාත්මක විය. එහි ප්‍රධාන ලක්ෂණ මෙසේ ය.

- කැබිනට් ආණ්ඩු ක්‍රමයක් වීම.
- වෙස්ට්මින්ස්ටර් රාජාණ්ඩු ක්‍රමය අහෝසි කොට ප්‍රථම වරට සමූහාණ්ඩු ක්‍රමයක් ඇති කිරීම.
- ජනතා පරමාධිපත්‍ය සංකල්පයට කේන්ද්‍රීය වැදගත්කමක් ලබා දීම.

- ජාතික රාජ්‍ය සභාව ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන එක ම නියෝජිතයා බවට පත් කිරීම.

- ජනතා පරමාධිපත්‍යය බලයෙන් පත් වූ අගමැති විසින් නාම මාත්‍ර විධායකයා පත් කිරීම. (සමූහාණ්ඩුව සතු වූ ලක්ෂණයකි)

ClassWork.LK

- සෝල්බරි ව්‍යවස්ථාවේ තිබුණ ඇතැම් සංවරණ සහ තුළන විධිවිධාන ඉවත් කිරීම.

  උදාහරණ :- අධිකරණය සතු සීමිත ව්‍යවස්ථා විවරණ බලය අහෝසි කිරීම. ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩලවාදය මත පිහිටුවීම. රාජ්‍ය සේවාව, කැබිනට් මණ්ඩලයේ පාලනය යටතට ගැනීම.

- ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ව්‍යවස්ථාගත කිරීම.

- රාජ්‍ය සහ බෞද්ධාගම අතර සම්බන්ධතාවට ව්‍යවස්ථාව තුළ පදනමක් ලබා දීම.

- සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම.

ClassWork.LK

- රාජ්‍ය සේවය සහ අධිකරණ සේවය වඩා සමීප ලෙසින් දේශපාලන විධායකය සමඟ සම්බන්ධ කිරීම.

- සෝල්බරි ව්‍යවස්ථාවෙන් නොසලකා හැර තිබුණු රාජ්‍යය ප්‍රතිපත්ති මූලධර්ම සහ මානව අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන 1972 ව්‍යවස්ථාවට ඇතුළත් කෙරිණි. එසේ වුව ද මේවා අධිකරණය මගින් ක්‍රියාත්මක කරවා ගත නොහැකි විය.

ClassWork.LK

ClassWork.LK